# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.08.18

වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 18 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ. ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-07-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-07-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-07-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** 2020-07-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

2020-07-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශේෂ නිවේදන යටතේ මූලිකව කියන්න ඕන අපි 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් පස්සේ මාර්තු මාසයේ 29 වන දින සභාවේ වැඩ භාරගෙන අපි වසර දෙකකට අධික කාලයක් ප්‍රාදේශීය සභාව පැවැත්වූයේ විපක්ෂය යටතේ. ඒ කියන්නේ ආණ්ඩුවක් නැතුව තමයි තිබුණේ. නමුත් පහුගිය මහා මැතිවරණයේදී අපිට, වර්තමාන රජයට ⅔ක බලයක් ලැබුණා. ඒ වගේම ඒ ⅔ බලය හිමිකරලා දීපු බෝපෙ පෝද්දල ජනතාවට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අපේ දිස්ත්‍රික්කයේ නායකත්වය දරණ, අක්මීමණ ආසනයේ නායකත්වය දරණ, වැවිලි කර්මාන්ත ගරු කැබිනට් අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට දෙලක්ෂය ඉක්මවපු වාර්තාගත ඡන්ද සංඛ්‍යාවක් ලබා දීම සම්බන්ධවත් ස්තුතිවන්ත වෙනවා. ඔය ආකාරයෙන් ගත්තම සියලුම කාරණාවලට ස්තුතිවන්ත වෙනවා. අපිට ගෞරවයක් තමයි රිචඩ් පතිරණ මැතිතුමාගේ පුත්‍රරත්නය ලංකාවේ කැබිනට් ඇමති කෙනෙක් වෙන එක. ලංකාවට කැබිනට් ඇමතිධූර විසි අටක් ලබා දෙන කොට එයින් ගාල්ල දිස්ත්‍රික්කයට වැවිලි කර්මාන්ත කැබිනට් ඇමතිධූරය ලැබුණා. ඉතිං ඒකට සහයෝගය දක්වපු සියලුදෙනාටමත්, ඡන්දය ලබාදීමෙන් හා අනෙකුත් ආකාරයෙන් සහයෝගය ලබා දීපු සියලුදෙනාටමත්, වර්තමාන රජයට ⅔ ක බලයක් සහිතව පිහිටුවීමට උපකාර කළ සියලුදෙනාටමත්, ඒකට නායකත්වය ගනිපු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාටත්, මහින්ද රාජපක්ෂ අගමැතිතුමාටත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මගේ ගෞරවනීය, කෘතවේදී ස්තුතිය පළ කරනවා. ඒ වගේම ඊට දායකවෙච්ච සියලුම මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් ඒ පිළිබඳව සභාපතිවරයා විදියට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පළ කරන්න ඕන.

ඒ වගේම අපේ ප්‍රාදේශීය සභාවේ හුසේන් කියාස් මන්ත්‍රීතුමා සමගි ජන බලවේගය පක්ෂය යටතේ පාර්ලිමේන්තු මහා මැතිවරණයට තරඟ කළා. එතුමා මනාප පහළොස්දහස ඉක්මවලා ලබා ගත්තා. ඒ පිළිබඳවත් අපි එතුමාට අපගේ සුභ පැතුම්, සුභාශිංශන මේ අවස්ථාවේදී පළ කරනවා. මොකද පළවෙනි වරට පාර්ලිමේන්තු මැතිවරණයකට අපේ ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරයෙක්, මන්ත්‍රීවරයෙක් තරඟ කරානම් ඒ කියාස් මන්ත්‍රීතුමා. ඉතිං ඒකෙදි එතුමාටත් අපි සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් අපේ සුභ පැතුම් මේ අවස්ථාවේදී එක් කරනවා.

ඒ ආකාරයෙන් ගත්තම ඉදිරියේදී අපිට වර්තමාන ආණ්ඩුවක් සමඟ, ප්‍රාදේශීය සභාවක් තියෙන ආණ්ඩුවක් විදියට අපි බලාපොරොත්තු වෙනවා පහුගිය වසර දෙකක කාලය තුළ අපෙන් මඟ හැරුණ, අතහැරුණ වැඩ ඉතාමත් සක්‍රීයව ඉදිරි අවුරුදු එකහමාර තුළ කරන්න. ඒකට අපි බලාපොරොත්තු වෙනවා. ඒකට පක්ෂ භේදයෙන් තොරව මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ සහයෝගය මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. ඒ වගේම කියන්න ඕන අපිට දිගින් දිගටම තිබුණ ප්‍රශ්නයක් තිබුණා. ඒක අබේසේකර මන්ත්‍රීතුමත් දිගින් දිගටම මතුකරා. ඒක අනවසර ඉදිකිරීම් පිළිබඳ ගැටලුවක්. අපි දැන් ඒකේ කිහිපයකටම නඩු දාන්න සූදානම් කරලා තියෙනවා. මම කලිනුත් ඉල්ලා සිටියා. අපේ නිලධාරීන්ට හොයහොයා ගිහිල්ලා අනවසර ඉදිකිරීම් නවත්වන්න විදියක් නැහැ. ඒක නිසා මොකක් හරි අනවසර ඉදිකිරීමක් වෙනවානම් හැකි ඉක්මනින් මාව හෝ අදාළ නිලධාරීන්ව දැනුවත් කරන්න කියන එක මම සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඇත්තටම අනවසර ඉදිකිරීම් ප්‍රමාණය වැඩි වෙන්න වැඩි වෙන්න අපිට හොයා බැලීමේ ප්‍රවණතාවයක් ගේන්න තියෙනවා. ඒ ආකාරයෙන් ගත්තම පරිසරයේ ගැටලු මතුවෙනවා. ඒක නිසා අපි කිසිකෙනෙකුට පක්ෂග්‍රාහිව ඉඳලා ඒවා නවත්වන්න කටයුතු කරන්නේ නැහැ. කවුද වැරැද්දක් කරන්නේ එයාගේ තරාතිරම නොබලා ඕන කෙනෙකුට නීතිය ක්‍රියාත්මක කරන්න අපි බැඳිලා ඉන්නවා. ඒ පිළිබඳව කිසි ගැටලුවක් හිතන්න එපා. ඕන කෙනෙක් අනවසර ඉදිකිරීමක් කරනවා නම් අපිව දැනුවත් කරන්න කියන එකත් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒ වගේම අයවැය පිළිබඳව යෝජනා තියෙනවානම් ලබා දෙන්න. මේ දවස්වල යෝජනා ලබා ගන්නවා. අයවැය පිළිබඳ යෝජනා තියෙනවානම් කරුණාකරලා ඉදිරිපත් කරන්න. අපි ලබන 25 වෙනිදා මන්ත්‍රීවරුන්ව කැඳවලා තියෙනවා අයවැය පිළිබඳ සාකච්ඡාවකට. ඒ වෙනකොට තියෙන යෝජනා අරගෙන එන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රීනි ඩී. ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පොඩි ඌන පූර්ණයක් කරන්නම්. ඔබතුමා ඉතා නිවැරදි විදියට ඉදිරිපත් කරා. අපිට සන්තෝෂයක් ඇත්තටම ඒකට. අපි විශ්වාස කරනවා අලුත් ආණ්ඩුව ලොකු වැඩපිළිවෙලක් ගෙන යයි කියලා. පක්ෂ භේදයකින් තොරව ඒකට සහාය දීම අපේ යුතුකමක්. අපි කවුරුත් එකතු වෙලා ඉන්නේ රටට වැඩක් කරන්න. ඒ නිසා ඒ සහයෝගය නොඅඩුව ලබා දෙනවා. ඒ වගේම මම හිතන්නේ ඔබතුමා මතක් කරා අපේ ඉතිහාසය පිළිබඳව. පාර්ලිමේන්තු මැතිවරණයට කියාස් මන්ත්‍රීතුමා ඉදිරිපත් වුණා. අපි ඡන්දය පාවිච්චි නොකරත් මේ අපේ සහෝදර මන්ත්‍රීවරයෙක්. ඒ විතරක් නෙමෙයි එතුමාගේ තියෙන විශිෂ්ටත්වය. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වඩා ඡන්ද ලබා ගෙන එතුමා ඒ පෙන්වපු හැකියාව ගැන මම හිතනවා ඉදිරි පළාත් සභාවට යන්න එතුමාට ඒක ශක්තියක් ධෛර්යක් වේවි. අපි එතුමාට සුභ ප්‍රාර්ථනා කරනවා.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත.**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අප ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග, පැති කාණු, පැති බැම්, බෝක්කු යනාදිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවර්ධනය කරනු ලබන්නේ නම්, අප ප්‍රාදේශීය සභාව දැනුවත් කර, අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ සේවා නිලධාරි සමඟ ඇස්තමේන්තු සකස් කරන ලෙස බෝපෙ පෝද්දල හා ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් අදහස් කරේ මේක. මොකද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරනවා. කරාට පස්සේ අපිට කිසිදු දැනුවත් කිරීමක් කරන්නේ නැහැ. අනිත් එක මොකක් හරි ප්‍රශ්නයක් වුණාම අපිට තමයි ප්‍රධාන වශයෙන්ම ඇවිත් කියන්නේ. මිනිස්සු දන්නේ නැහැ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරාද, ප්‍රාදේශීය සභාවෙන් කරාද කියලා. ඒක හින්දා සියලුම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වෙනකොට අපේ තාක්ෂණ නිලධාරීන් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කරන්න කියන එක තමයි කියන්නේ. සමහර වෙලාවට පාරේ පළල වෙන ප්‍රමාණයක්. හදන්නේ වෙන ප්‍රමාණයකට. සමහර තැන් තියෙනවා එකම පාරේ කොටසක් අඩි දහයට හදලා තියෙනවා. අනිත් කොටස අඩි අටට හදලා තියෙනවා. ඔය වගේ ගැටලු තියෙනවා. ඉතිං ඒකෙදී මේක විධිමත් කරන්න තමයි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ. අපේ තාක්ෂණ නිලධාරීන්ගේ සහාය ඇතිව ඒ කටයුත්ත කරන්න කියලා තමයි යෝජනා කරේ ඇස්තමේන්තු සකස් කිරීමේ ඉඳගෙන වැඩේ අවසානය දක්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම හිතන්නේ මේක හොඳ යෝජනාවක්. මේ යෝජනාවම අපි මීට කලිනුත් ගෙනාවා. ඒකෙදී ඔබතුමා මේ කියපු පැත්ත විතරක් නෙමෙයි සමහර වෙලාවට අපි ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා ඒ පාරට. අපි දන්නෙත් නැහැ අරහෙන් හදලා. එතකොට මේවා මාරු කරන්නත් වෙලාවක් යනවා. මම දන්නේ නැහැ කියන්න ඒකේ ප්‍රායෝගික පැත්ත මොකක්ද කියලා. සභාව දැනුවත් කරලා කරාම අපේ කිසිම මන්ත්‍රීවරයෙක් ප්‍රතිපාදන තමන් කොහෙන් ගෙනාවත් වෙන් කරන්නේ නැහැ. ඒක තමයි පළවෙනි කතාව. දෙවෙනි එක තමයි ඒ පාරේ පළල පිළිබඳව. දිග දාන්න පුළුවන් ප්‍රමාණයෙන් දාන්නේ මුදල් ප්‍රමාණය අනුව. නමුත් පළල පිළිබඳව අපේ අදහස, සභාවේ අදහස අරගන්න ඕන. ඒක ඉතා වැදගත්. මම දන්නේ නැහැ ඒක. ඒක කවුරු හැදුවත් ඒ නිලධාරීන්නේ හදන්නේ. නමුත් අර අදහස දන්වා යවන්න සියලුම ඒවාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** අප ප්‍රාදේශීය සභාවට අයත් වාහන සේදීම සඳහා ප්‍රධාන කාර්යාලයේ පුස්තකාල ගොඩනැගිල්ල අසල ස්ථානය සංවර්ධනය කිරීමටත් වාහන සේදීම සඳහා අවශ්‍යවන උපකරණ මිලදී ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ගාල්ල, වටරැක නැගෙනහිර, කහගල වත්තේ පිහිටි අනතුරුදායක ගල් බැම්ම කඩා ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ ගල් බැම්ම උසාවි නියෝගයකින් ඉවත් කිරීමට දුන්න එකද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ උසාවි නියෝගය ඔබතුමා කියෙව්වද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මට ඒකේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒකේ කියනවා ගල් බැම්ම ඉවත් කිරීමේදී යම්කිසි හානියක් සිදු වෙනවා නම් ඒක ඉවත් කරන පාර්ශවය දැරිය යුතුයි කියලා. එහෙම තීන්දුව දෙනවානම් උසාවියෙන් කඩලා ඉවත් කරන්න බැරි ඇයි. අපි මේ ගල් බැම්ම කඩන්න ගිහිල්ලා අවධානමක් ගන්න ඕන නැහැ. උසාවියෙන් කඩලා ඉවත් කරන්න කියලා තීන්දුවක් දීලා තියෙද්දී ඇයි ඒ අය ඒක කඩන්නේ නැත්තේ. මේ නිවසට හානියක් වුණොත් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි බලන්නේ මන්ත්‍රීතුමා මෙතනදී එකේ ගමන් කරන අයට වෙන හානිය. ඒ ගල් බැම්ම අනාරක්ෂිතයි. උසාවි තීන්දුව නෙමෙයි තව පැත්තක් තියෙනවා. උසාවි තීන්දුව දීලා තියෙන්නේ මේ පැත්තටනේ. ගල් බැම්මේ අනිත් පැත්තේ මුහුණතකුත් තියෙනවා. එතනදී අපි බලන්නේ උසාවි තීන්දුවට වඩා මේ වෙලාවේ පාරේ යන අයගේ ආරක්ෂාව. උසාවි තීන්දුව දුන්නට වැඩේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු උප සභාපති ජේ. ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ අරක නිසා. උසාවිය වංගු ගහන තීන්දුවක් දීලා තියෙන්නේ. වෙන තැන්වල උසාවි තීන්දු දෙන කොට මෙහෙම කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා මම කියන්නේ පොදුවේ. ඒ මිනිස්සු පුද්ගලිකව මේ නඩුව දාලා තියෙන්නේ. ඒ නඩුව දාලා අඩි අටට පාර දෙන්න තියෙන්නේ. අපි සද්භාවයෙන් වැඩ දෙකම කරමු. එකක් අඩි අටට ඒ මිනිස්සුන්ට පාර අරගෙන දෙමු. බැම්මත් කඩලා ඉවත් කරමු. ප්‍රශ්නයක් වුණොත් අනෙක් පාර්ශවයට අපිට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න කියන්න. අපිට මහජනතාවගේ ආයතනයක් විදියට මේ වගේ දෙයකටවත් මැදිහත් වෙන්න බැරිද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔතන එකම පවුලේ අයගේ ප්‍රශ්නයක් තියෙන්නේ. එතකොට මේ ප්‍රශ්නයේදී පාර ඉල්ලලා නඩුවක් දැම්මා මේ අය. නඩුවෙන් තීන්දු වුණා පාර අඩි අටට කඩන්න කියලා. හැබැයි ඒකේදී කොන්දේසියක් දාලා තියෙනවා හානියක් නොවන විදියට කඩන්න කියලා. එතනදී හැබැයි මෙයාලා මුදලකුත් ගෙවලා තියෙනවා. ඔය ඉඩම අයිති පාර්ශවයට රුපියල් හැට දාහක මුදලකුත් ගෙවලා තියෙනවා කඩන්න කියලා. එහෙම තියෙද්දිත් තමයි මේ කාරණය මෙහෙම සිද්ධ වෙන්නේ. එතනදී මම දකින්නේ ඒ මිනිස්සු දිගින් දිගටම පාර ඉල්ලනවා. පාරක් කියන එක අපි දෙන්න ඕන. උසාවි ගිහින් තීන්දුවක් අරගෙන තමයි මේ විදියට කරලා තියෙන්නේ. හැබැයි ඒ අයට තියෙන අවධානම තමයි උසාවිය දීපු තීන්දුව අනුව කැඩුවොත් මේ අයට හානියක් වෙයි කියලා බයයි. එහෙම වෙයි කියලා තමයි මේ අය සභාව හරහා අපෙන් මේ ඉල්ලීම කරන්නේ මේක අපිට බේරලා දෙන්න කියලා. එතනදී මම දකින්නේ අඩි අටට පාර දෙන්න ඕන ඒ මිනිස්සුන්ට. කාටත් පාරක් අවශ්‍යයිනේ. එතකොට මෙතන දැන් වෙලා තියෙන්නේ එකම පවුලේ අක්කලා, මල්ලිලාගේ ළමයි අතර ආරවුලක් තියෙන්නේ. දැන් ලැජ්ජාව පිළිබඳ ප්‍රශ්නයක් මෙතන තියෙන්නේ. මොකද පාර කඩන්න ඉඩ නොදෙන කට්ටිය ඉන්නවානේ. ඒ පාර්ශවයට ලැජ්ජාව පිළිබඳ ප්‍රශ්නයක් තමයි මෙතනදී තියෙන්නේ. උසාවියෙන් තීන්දුවක් දීලා තියෙනවානේ මේක කඩලා ඉවත් කරන්න කියලා. එම නිසා අපි සභාව මඟින් තීන්දුවක් ගන්න මේක හානියක් නොවන විදියට කඩලා ඉවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කිව්වේ අපි අඩි අටට සභාවේ කම්කරුවෝ දාලා කපමු. මැෂින් දාන්නේ නැතුව සභාවේ කම්කරුවෝ දාලා හරියටම පාර අඩි අටට කපමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හරි එහෙම කරමු. දවස් දෙකක වැඩ තියේවි ඕන නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි. ප්‍රාදේශීය සභා පනතේ 35 වන වගන්තියේ මෙහෙම තියෙනවා. " යම් ප්‍රදේශයක, යම් වීදියකට හෝ මංමාවතකට යාවූ යම් නිවසක්, ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ ඊට සවිකර ඇති යම් කිසිවක්, අන්ත්‍රාදායක වුවද, නොවූවද, අබලන්වූ තත්ත්වයක පවතී යයි හෝ ඇද වැටීමට ඉඩ තිබේ යයි එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව

විසින් සලකනු ලැබුවහොත්, ඒ වීදිය හෝ මංමාවත පාවිච්චි කරන තැනැත්තාගේ ආරක්ෂාව සඳහා නිසි ලැලි ආවරණයක් හෝ වැටක් හෝ අවශ්‍යයයි පෙනී යන්නේ නම් එවැනි ආවරණයක් හෝ වැටක් ප්‍රාදේශීය සභාව විසින් වහාම ඉදිකරවිය යුතු අතරම ඒ නිවස, ගොඩනැගිල්ල, මායිම් තාප්පය, ගේට්ටුව හෝ එහි සවි කර ඇති දෙය පවතින තත්ත්වය අනුව අවශ්‍ය පරිදි, වහාම කඩා දමන ලෙස, ස්ථාවර කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දීමටද සැලැස්විය යුතුය.''

පනතෙන්ම මේ බලය තියෙනවා කඩා ඉවත් කිරීමට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අයට දැන්නුවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දන්වලා තියෙන්නේ. කරන්නේ නැහැ. ඒ අය අභිමානයට ඉන්නවා. මම කියන්නේ පනතෙන් අපිට තියෙන බලය එකක්. අධිකරණ තීන්දුවකුත් තියෙනවා ඒක තව එකක්. එහෙම එකේ අපිට ඒ මිනිස්සු කියනවා පාර්ශවකරුවෝ වෙන්න කියලා. මැදිහත්කරුවෝ වෙන්න කියනවා. අපිට සභාවක් විදියට මැදිහත්කරුවෝ වෙන්න බැරිනම් වැඩක් නැහැ මම දකින විදියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක කරන්න ගියාම මේ අය රණ්ඩු වෙනවානේ. ඒ රණ්ඩුවට නොගිහින් මේක බේරගන්න තමයි මේ අය බලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සභාවේ කම්කරුවෝ යොදවලා මේක කඩා ඉවත් කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට කාටවත් හානියක් නැහැ. අන්තිම දවසට ඒ දෙගොල්ලොත් හොඳ වෙයි. අනවශ්‍ය වියදමක් මේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේක මගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්. තාප්පයේ අයිතිකාරයොන්ගේ විරෝධතාවය තියෙන්නේ. ගෙවල් කිහිපයක අවශ්‍යතාවය මේක. මේකට සභාවෙන් මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** හපුගල, නරගහදොලගාව වත්තේ සව්සිරි මාවතට ප්‍රවේශවන මාර්ගය හා නරගහදොලගාව වත්තේ ප්‍රධාන මාර්ගයට ප්‍රවේශවන මාර්ගයේ දකුණු පෙදෙසේ වැසී ගිය කාණු බැම්ම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** ''අපි වෙනුවෙන් අපි'' නිවාස යෝජනා ක්‍රමය මඟින් ගොඩකන්ද, පරකැටිය වෙන්දේසි ඉඩමේ අංක 21 දරණ ඉඩමේ ඉදිකිරීමට යෝජිත නිවස ඉදිකිරීමේදී හමුදා සෙබලුන්ට රැඳී සිටීම සඳහා අප ප්‍රාදේශීය සභාවට පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද කොටසේ මාස හයක කාලයක් සඳහා තාවකාලික ඉදිකිරීමක් සිදුකිරීමට අවසරය ලබා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හමුදාවෙන් මේ ගේ හදලා දෙන්නේ. ඒ නිසා එතනදී අපෙන් ඉල්ලනවා ඒක තාවකාලිකව. ඒකට මට අවසරය දෙන්න තිබුණා. නමුත් සභාව දැනුවත් කරලා කරන එක වඩාත් හොඳ හින්දා මෙහෙම කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අප ප්‍රාදේශීය සභාවේ වරිපනම් අංශයේ ඊ. එල් .ජී මෘදුකාංග පද්ධතියේ නඩත්තු සහ සේවා කටයුතු සිදුකිරීම සඳහා සික්රා සොලුයුෂන් පුද්ගලික සමාගම සමග රු.80,000.00ක මිලට වාර්ෂිකව නඩත්තු සහ සේවා ගිවිසුමකට එළඹීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ගිය සභාවට දාපු යෝජනාව මේ. ඒක වඩා විධිමත්ව දාලා තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි.

**07.** බෝපෙ එගොඩ කනත්ත ප්‍රජා ශාලාව ඉදිරිපිටින් ඇති මාර්ගය සහ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මගේ යෝජනාව විදියට තියෙන්නේ ගියවර සභාවේදී ලියුමකින් ඉදිරිපත් කරපු හතර දේවාලය පන්සල ඉදිරිපිටින් ඇති පාරේ තියෙන ගැටලුව නිරාකරණය කිරීම. ඒකෙදී පාරට වතුර එවන තත්ත්වයක් තියෙනවා. ඊළඟට පාර දෙපස සුද්ධ කරලා කාණු බැඳීමට මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 08.** වක්වැල්ල ප්‍රධාන මාර්ගයේ සිට මහවත්ත ඉසුරු පෙදෙස මාර්ගයේ පවතින අනවසර ඉදිකිරීම හැකි ඉක්මනින් කඩා ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මේකට දැන් උසාවි නියෝගයක් ඇවිල්ලා තියෙනවා. මම හිතන්නේ පිස්කල් නිලධාරි ඇවිල්ලා, ඊට පස්සේ මොකක් හරි ලිපියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වැඩේ නතර වෙලා කියලා දැන ගන්නට තියෙනවා. මට මේක පැහැදිලි නැත්තේ රජයේ නිලධාරියෙක් මේ ගොඩනැගිල්ලට කිසිම අයිතියක් නැති කෙනෙක්ගේ නමක් උසාවියට යෝජනා කරපු එක. මොනවා හරි දෙයක අයිතියක් තියෙනවානම් ඒ අයිතියට ලියවිල්ලක් තියෙන්න ඕනනේ. දැන් මේකේ කිසිම අයිතිකාරයෙක් නැහැ. අයිතිකාරයෙක් නැති ගොඩනැගිල්ලකට අයිතිකාරයෙක් ඉන්නවා කියලා නඩුවක් දාලා, කොහේවත් ඉන්න මනුස්සයෙක්ගේ නමක් දාලා නඩු දාලා ඒ මනුස්සයා කියනවා මේක මගේ නෙමෙයි කියලා. ඇත්තටම ඒ මනුස්සයාගේ නෙමෙයි ඒක. ඒකට කවුරුවත් අයිතිකාරයෙක් නැහැ. මම යෝජනා කරනවා නීතිඥ මහත්තයාට කීයක් හරි දීලා හරි මෙතනට ඇවිත් බලලා යන්න කියලා. මේක අයිතිකාරයෙක් නැති ගොඩනැගිල්ලක්. මේක උසාවියට එක පාරකින් කරුණු ඉදිරිපත් කරලා පළවෙනි සැරේටම මේකේ තීන්දුව ගන්න පුළුවන්. අයිතිකාරයෙක් නැති ගොඩනැගිල්ලක්. අනවසර ඉදිකිරීමක්. මේක හිරිහැරයක් ඒ මිනිස්සුන්ට. දැන් දෙපාරක් ලක්ෂ පහ, පහ ලක්ෂ දහයක් ආවා මෙතන බැම්ම සංවර්ධනය කරන්න. ලක්ෂ දහයම ආපහු ගියා මේ ගොඩනැගිල්ල තියෙන නිසා හදන්න විදියක් නැතුව. ඒ නිසා බරපතල ප්‍රශ්නයක් මේක. මේක මම කියන්නේ නීතිඥ මහත්තයත් එක්කත් සාකච්ඡා කරලා කියන්න මේකට අයිතිකාරයෙක් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකේ තීන්දුව දුන්නා. මේකේ අපිට පුළුවන් එකම දේ ග්‍රාම නිලධාරීගෙන් තමයි තහවුරුව ගන්න පුළුවන් අයිතිකරු කවුද කියලා. ග්‍රාම නිලධාරි දීපු නමට තමයි අපි පැමිණිල්ල දැම්මේ. ඒකෙදි කඩා ඉවත් කරන්න තීන්දුව දුන්නා. පිස්කල් එකෙන් ආවා පහුගිය නම වෙනිදා. ගිය මාසේ නම වෙනිදා. පිස්කල් එකෙන් ඇවිල්ලා කඩා ඉවත් කරන්න හදනකොට එයා එයාගේ නෙමෙයි කිවුවා. වෙන කෙනෙක් ඉදිරිපත් වුණා අයිතිය එයාගෙයි කියලා. ඒකේ එයාගේ අම්මාගේ නමට තමයි වරිපනම් ගෙවලා තියෙන්නේ. මැරිච්ච කෙනෙක්ගේ නමට.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** වරිපනම් ගෙවන්න පුළුවන්නේ ඕන කෙනෙකුට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වෙලා තියෙන්නේ නැවත නඩුව පැවරුවා. පැවරුවේ අරයාගේ නමට.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මියගිය කෙනාගේ නමටද පැවරුවේ. අම්මා මිය ගිහිල්ලානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අම්මාගේ නමට තමයි දාන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** නීතිඥ මහත්තයා හරහා කියන්න මේකට අයිතිකාරයෙක් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඩඩ්ලි මන්ත්‍රීතුමා අපිට පුළුවන් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන්ගෙන් විස්තර ගන්න. වෙන ක්‍රමයක් මොකක්ද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එයාගේ නම වෙනුවට වෙන කාගේද නමක් දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කියන්නේ. වෙන කවුද ඉන්නේ. අපිට ගමක තියෙන දේපලක අයිතියක් හරි, මොකක් හරි තොරතුරක් ගන්න වෙන කවුද ඉන්නේ. අනිත් එක උසාවියට. නිකං අපි කට වචනයෙන් ගනිපු එකක් නෙමෙයි මේ. රාළහාමි උසාවියට ලියුම දුන්නා මෙතන අහවල් කෙනාට අයිතියි කියලා. අපි නඩුව ඒ කෙනාට පැවරුවේ. නමුත් නඩුව ඉවර වෙලා පිස්කල් එකෙන් දැම්මට පස්සේ ඒ කෙනත් කියනවා අයිතිය මට නෙමෙයි කියලා. වෙන කෙනෙක් කියනවා එයාට අයිතියි කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඔය කියන කාන්තාව මිය ගිහිල්ලා. දැන් ඔය මිය ගියපු කාන්තාවකට නඩු දාලා ඊළඟට ඒක ප්‍රශ්න වෙලා ඇදි ඇදී යනවානේ. බරපතල ප්‍රශ්නයක්නේ ඒක නිසා ඇතිවන්නේ. මේක නිසා අනතුරු ඇති වෙනවානේ. දැන් අතනින් ඇවිල්ලා වාහනයක් පාරට දාන කොට පාර පේන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන් නැවත අලුත් කරලා අපි භාරදීලා තියෙන්නේ. ඒකට එක පාරින් තීන්දුවක් ලබා දේවි. ඒක වැඩිකල් යන එකක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** නීතිඥ මහත්තයාව දැනුවත් කරන්න මේකේ ප්‍රශ්නය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 09.** මහවත්ත මාර්ගයේ ඇතුළතට ගමන් කරනවිට වම් පස පිහිටි අනුර මහතාගේ පළමු නිවසේ ගේට්ටුව අභියස ප්‍රධාන මාර්ගය අවහිර වන සේ යොදා ඇති කොන්ක්‍රීට් කොටස (ගොඩනැගිලි ද්‍රව්‍ය සමඟ) ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** දැන් ඔය පාර හදාගෙන යනකොට ඕකේ රුපියල් ලක්ෂ දහයක විමධ්‍යගත අරමුදල් වලින් තමයි ඔය බැම්ම බැඳගෙන ගියේ. ඒ බැම්ම ඔය අනුර මහත්තයාගේ ගෙවල් ගාවට බඳින්න දුන්නේ නැහැ. ඒ බඳින්න දුන්නේ නැති වෙලාවේදී අපේ ලලින්ද ගමගේ හිටපු ප්‍රාදේශීය ලේකම්තුමා ඔතනට ඇවිල්ලා කිව්වා මට මේක බඳින්න ඉඩ නොදුන්නොත් මම මේ ඇළේ නියම ප්‍රමාණය අරගෙන ඇළ කපනවා කිව්වා දිගටම. එතකොට ගේත් එක්කම කඩාගෙන යනවා. ඊට පස්සේ තමයි එයා කැමති වුණේ. ඒ කැමති වෙලා තමයි එතන බැම්ම බැන්දේ. දැන් එතන බඩු ගෙනල්ලා දාලා තියෙනවා. ගොඩනැගිලි ද්‍රව්‍ය, උළු කැලි, ෂීට් කැලි සේරම එතන දාලා. එතන කොන්ක්‍රීට් කුට්ටියක් දාලා තියෙනවා. පහුගිය දවසක මම වාහනයෙන් මේ පැත්තට එනකොට මෙහෙන් බයිසිකලයක් ඇවිල්ලා ඒ බයිසිකලය පිටි පස්සෙන් පිටි පස්සට යන්න ගිහිල්ලා අර කොන්ක්‍රීට් කැල්ලේ වැදිලා ඒ මනුස්සයා වැටුණා. තුවාලත් වුණා. ඉතිං මම කියන්නේ පාරවල් අවහිර කරනවා මේ මිනිස්සු. මෙන්න මේවා කරුණාකරලා ඉවත් කරලා මාර්ගය පිරිසිදු කරලා දෙන්න. පහුගිය දවස්වල මහා විශාල ගල් ගෙනල්ලා දාලා තිබුණා. ඇළට දාන්නද දන්නේ නැහැ. අද නම් ගල් ටික නැහැ. ගල් ටික කොහේ දාලද දන්නේ නැහැ. මොනවා කරනවාද දන්නේ නැහැ මේ මිනිස්සු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 10.** මහවත්ත මාර්ගයේ පළමුවන පටුමග ආසන්නයේ පිහිටා ඇති දිරාගිය හික් ගස අනතුරුදායක ලෙස පවතින බැවින් හැකි ඉක්මනින් කපා දැමීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

රුපියල් පන්සීයයි යන්නේ මේ වැඩේට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 11.** කලේගාන මංසන්ධිය අසල පවතින පොළ භූමිය නිසා සෑම අඟහරුවාදා දිනකදීම මහජනතාව දැඩි අපහසුතාවයට පත්වන බැවින් හැකි ඉක්මනින් එම පොළ භූමිය එතනින් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒකට මම කියන්නේ තමුන්නාන්සේලාගේ රජයක් තියෙන්නේ. තමුන්නාන්සේලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න. පොළ භූමිය මෙතනින් ඉවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොළ භූමිය දැනට අපි පියදිගමට ගෙනියන්න කතා කරලා තියෙන්නේ. ඒක දැනට සිකුරාදාට කරන්නේ. අඟහරුවාදාට පොළ එතනට දාලා මෙතන බිල්ඩින් එකක් හදන්න යන්න බැලුවේ. අපිට ඉතිං ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ආදායම නැතිවෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට ආදායමක් නැති වෙනවානේ. පන්සල් භූමියේ හරි පොළ කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මේක පෝද්දලට දාන්න. එතකොට අපිටත් ආදායමක් එනවානේ. නැත්නම් හපුගලට ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නැත්නම් වක්වැල්ලට ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** වක්වැල්ලට ගත්තොත් බද්දේගමට යනවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වක්වැල්ලේ අපේ ඉඩම් කෑල්ලක් තියෙනවා. බලමු මොකක් හරි කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** වක්වැල්ල පැත්තට ගෙනියන්න බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලැන්දෑවේ මහා බෝධි එකට අයිති ඉඩමක් තියෙනවානේ. ඒක බලමු කියලා ඇමතිතුමා කිවුවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අන්න ඒක හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඒකට මැදිහත් වෙන්න සුගත් මන්ත්‍රීතුමා. කොතනද ඒ ඉඩම තියෙන්නේ ලැන්දෑව හන්දියේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගැරිජ් එකත් එක්කම කැලේ කෑල්ල. එතන ලොකු ඉඩමක් තියෙනවා. ඒක අපිට පවරාගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ටිකක් ඔබතුමා මැදිහත් වෙන්නකෝ. රමේෂ් පතිරණ ඇමතිතුමා කිවුවා කතා කරන්න ඒක කරලා දෙන්නම් කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම නම් මෙහෙමයි. එතන තියෙන්නේ සභාපතිතුමා ලැන්දෑවේ හන්දියත් එක්කම. බෝපෙ උතුර ග්‍රාම සේවා වසමේ තමයි ඒ ඉඩම පිහිටලා තියෙන්නේ. එතකොට අපිට එතන සෑහෙන ඉඩ ප්‍රමාණයක් තියෙනවා. අක්කර ගාණක් තියෙනවා. හැබැයි මැද හරියේ ගෙයක් එහෙම හදලා තියෙනවා. ඒ ටික එහෙමම කොටු කරලා දීලා අපිට ඒ ඉඩම පවරාගන්න යෝජනාවක් විදියට ඊළඟ සභාවට ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම කරලා අපි සාකච්ඡා කරලා බලමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ යෝජනාව සංශෝධනය කරලා ඒ යෝජනාව දැන් ගේන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාව කැමතිනම් මේ ආපු යෝජනාව සංශෝධනය කරලා ගමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ ඉඩම බද්දට ගත්තම ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක විධිමත් යෝජනාවක් විදියට ගේමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ) කාරක සභාවල වාර්තා

01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-08-14 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. තාක්ෂණික සේවා කමිටුව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-08-14 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව **ඃ- නැත**

04. පරිසරය සහ පහසුකම් කමිටුව **ඃ- නැත**

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-

01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

04. වෙනත් ලේඛන **ඃ- නැත**

(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා

පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ අගෝස්තු මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී ඔබතුමා ඉදිරිපත් කරලා තියෙනවා අනවසර ඉදිකිරීම් පිළිබඳව. ඒක මම හිතනවා ප්‍රගතියක් කියලා. අපි දැන් අනිත් පැත්තට හැරිලා පිළිගන්න වෙනවා. අපේ පැත්තෙන් කෙරෙන්න ඕන දේකුත් තියෙනවා. කමිටුවක් පත් කරලා තියෙනවා. ඒ නිසා අපි මේ බදාදායින් පස්සේ බ්‍රහස්පතින්දා ඉඳලා එක දිගට රැස්වෙමු. මම මේ වෙලාවේම අපේ ඉන්දික මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. සභාපතිතුමා ඔබතුමත් පුළුවන්නම් සහභාගි වෙන්න. ඊළඟට අපිට දෙන්න ඒකට කවුරුහරි ලිපිකරු මහත්තයෙක් හරි මහත්මියක් හරි මේවා සටහන් කර ගන්න. ඒකට අවශ්‍ය සහයෝගය දෙන්න. ඒක ක්‍රමවත් කරලා අපි ඉදිරි කාලයේදී ඒ අඩුපාඩු ටික හදලා නඩු දාන්න හදාගමු අනවසර ඉදිකිරීම් පිළිබඳව.

ගරු සභාපතිතුමා, ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා අපේ හිතවත් මිල්රෝයි මහත්තයා. මේ අයව ගෙන්වලා අහන්න. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ දෙපැත්තේම අය ගෙන්වලා මේක විසඳන්න. මම මේකෙදී ඔබතුමාට කියන්නේ වෙන දෙයක් හින්දා නෙමෙයි. දැන් මම මීට කලිනුත් ඉල්ලලා තියෙනවා. අඩු ගානේ වෙන්දේසි කරන්න තියෙන ඉඩමකට කේවියට් එකක් දාලා තියෙනවානම් ඒක නතර නොකරට කමක් නැහැ, හැබැයි කේවියට් එකක් දාලා තියෙන එක ප්‍රසිද්ධ කරන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මිල්රෝයි මහත්මයා ඉල්ලන එකේ තොරතුරු කිසිම දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නැති වෙන්න පුළුවන්නේ. එයා නඩුවක් දාලා තියෙනවා එහෙම කියලා ඉල්ලලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය අංකයෙන් නඩුවක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ නඩු අංකයක් දාලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකේ කියලා තියෙන විදියට නඩුවක් නැහැනේ. තිබිලා තියෙන්නේ අර නඩුව විතරයි දයාරත්න මහත්තයා එක්ක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ දෙගොල්ලෝ ගෙන්නලා සාකච්ඡාවක් කරන්න පුළුවන්. සාකච්ඡා කරලා ඔය තත්ත්වය පැහැදිලි කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට ලියුමක් යවලා තියෙන්නේ. ඕනනම් මේක අභියෝගයට ලක් කරලා අධිකරණයට යන්න පුළුවන් කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ මේකේ පූර්වාදර්ශ තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙයත් මෙහෙම වැරදි තැනක ඉන්නේ. අපේ ඉඩමකටත් ඔප්පුවක් හදලා තියෙනවානේ. බෝපෙ පන්සල ඉස්සරහ අර ලෑලි වලින් හදපු එකටත් හොර ඔප්පුවක් හදලා දීලා තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං මෙහෙම තියෙන්නේ ගරු සභාපතිතුමා. මේකේ නම් ගම්, අරවා මේවා බලන්නේ නැහැ. අපි කියන්නේ සභාවට අයිති ඉඩම් කොටස් අද නැති වෙලා ගිහිල්ලා තියෙනවානේ. ඒවා ගැන අපි බලමු. ඒක ගැන දැන් කතා කරලා වැඩක් නැහැ. ඔය ගැන බලන්න මේවා චෙක් කරලා තියෙන්න ඕන. ඊළඟ පරම්පරාවට හරි මේක ගෙනියන්න ඕන. ඒ වගේම දැන් අපේ අතින් වෙච්ච වැරදි බලන්න. ඒක අපි දිගටම කියනවා. ජයමිණි සෙනෙවිරත්නලාගෙන් අද ඉඩම් ගනිපු අය අමාරුවේ වැටිලා තියෙනවා. මොකද ඒ ප්‍රශ්නය ගැන මම කතා කරා. ලිඛිතව දුන්නා. දැන් ඒක ගැන කතා කරන්න වෙලාවක් නැහැ. නමුත් එකක් තියෙනවා. ඒකේ පවුලෙත් ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මට චෝදනා කරනවා මම විරුද්ධ වෙනවා මෙහෙමයි කියලා. මම විරුද්ධ වෙලා නෙමෙයි දැන් මේක නරක තත්ත්වයකට ඇවිල්ලානේ තියෙන්නේ. ඉතිං ඒක නිසා මම කියන්නේ අපිට එහෙම දෙයක් ආවම නඩු දාන්න කියන එක හරි. ඒ දෙගොල්ලොන්ම කැඳවලා ඉවර වෙලා නඩු දාලා විසඳගන්න කියන එකයි වඩා හොඳ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලිඛිතව දීලා තියෙනවා නඩුවක් දාන්න කියලා.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රීනි කේ. එල්. එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ප්‍රගතිය පිළිබඳව කතා කරද්දි මම කතා කරන්නේ අර කරාපිටියේ පන්විල දූව වත්තේ ප්‍රශ්නය. අපි දැන් මුදල් වෙන් කරලා තියෙනවා ලක්ෂ පහක් ඒකට. ඒකට ඔබතුමාටත් චෝදනා එල්ල වෙලා තියෙනවා, මටත් චෝදනා එල්ල වෙලා තියෙනවා අර කාණුව සම්බන්ධව. ඒකට මොකක්ද ගන්න තීන්දුව. ඒ මුදල් ටික දැන් එහේ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපේ තාක්ෂණ නිලධාරීව සම්බන්ධ කරලා දෙන්නම්. එහේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි එක්ක ඒ කටයුත්ත කරන්න කියන්න. කිසිම බාධාවක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මෙහේ තාක්ෂණ නිලධාරීත් ගියා. එහෙනුත් මම කීප පාරක්ම එක්ක ගෙන ආවා. හැමදාම අපි ඔය තැන නවතිනවානේ. අවසානයේ මොකක් හරි කරන්න පුළුවන්ද බැරිද කියලාවත් කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේනේ මුදල්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මෙහේ දැනුවත් කරලා තියෙනවා. මට පිටපතක් ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරීන් කතා කරගෙන ඇස්තමේන්තුවක් හදන්න කියන්න. ඒකට අපි අවශ්‍ය දේ කරලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මුදල් යොදවන්න බැහැ කියනවා පෞද්ගලික ඉඩම් හරහා යන ඒවාට. ඒක සභාපතිතුමාට දැනුවත් කරා කියලත් කියනවා.

මෙහේ අනවසර ඉදිකිරීම් පිළිබඳව නඩු දාන්න විදියක් නැහැ. මේ සිද්ධිය කතා කරන වෙලාව වෙනකොටත්, මේ පැමිණිල්ල සභාවේ කතා වෙන අතරතුර අර වෛද්‍යවරයාගේ නිවසේ බිම් සැලැස්ම අනුමත කරලා දීලා තියෙනවා. එතකොට ඒක කරන අවස්ථාවේදීම වෛද්‍යවරයා ඒක අනුමත කර ගත්තට පස්සේ ඒක හරහා ජලය බැසයාමට තිබුණ අඩියක විතර බටය ගලවලා වීසි කරලා තියෙනවා. දැන් වතුර බිංදුවක්වත් පහළට එන්නේ නැහැ. පොඩි වර්ෂාවකදී වුණත් අඩි හයක් විතර බිත්ති යටවෙනකම් වතුර පිරෙනවා. දැන් අපිට මේක විසඳන්න විදියක් නැහැ. තිබුණ බටය නැවත සකසන්න කියලා තමයි මම ඉල්ලන්නේ. වෙන විකල්පයක් අපිට නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙම ගැටලුව සම්බන්ධව තාක්ෂණ නිලධාරීට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම ඉඩම අයින දිගේ කාණුව සකස් කිරීමේ කටයුතු සූදානම් කළ පසු සුභසිංහ මහත්මිය විසින් තාප්පයක් බැඳීමට කටයුතු සූදානම් කළ බවත්, ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි එම තාප්පය බැඳීමේ කටයුත්ත සිදු කිරීම නතර කළ බවත්, නමුත් එම තාප්පය මේ වන විට ඉදිකර අවසන් බව.
- කාණුව ඉදිකිරීම සඳහා තම ඉඩමෙන් ඉඩ ලබා දීම සිදු කළ නොහැකි බවට සුභසිංහ මහත්මිය විසින් දැනුම් දුන් බව.
- මේ ගැටලුව සඳහා විකල්පයක් ලෙස වෛද්‍යවරයාගේ ඉඩම අයින දිගේ කාණුවක් ඉදිකර වෙලට වතුර බැස්සවීමට කටයුතු කළ හැකි බව.
- මීට අමතරව මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ට ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරීව දැනුවත් කරා එයාගේ විකල්ප ක්‍රම ඉදිරිපත් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා අපේ නිවස ඉදිරිපිටම මම හිතන්නේ පහුගිය දවසක ඉඩමක් අනුමත කරලා තිබුණා. ඒක කුඹුරු ඉඩමක්. පොල්ගස් වගයක් කපාගෙන ඇවිල්ලා දාලා, පස් දාලා කෙළින් අතට ආපු ඇළ මාර්ගය මේ අය වෙනස් කරලා තියෙනවා. ඒකත් මම අරගෙන බැලුවම ප්ලෑන් එක අනුමත කරලා දීලා තියෙනවා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කියන කුඹුරු ඉඩම කොහොමද අනුමත කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපේ නිවස මෙහා පැත්තෙම හැරෙන තැන ඉඩම. අපේ ගෙදරට හැරෙන තැන පිට්ටනියක් වගේ කැල්ලක් හරි ගස්සවලා තියෙනවා. ඒක ඉස්සර ඉඳන්ම තිබුණ කුඹුරු ඉඩමක්නේ. දැන් ඒකට මම පහුගිය සභාවක යෝජනාවක් ගෙනල්ලා අනුමත කරපු එකත් තහනම් කෙරෙව්වා. දැන් ඒක අනුමත කරලා තියෙනවා. ජලය බැස යන ඇළ මාර්ගය වෙනස් කරලා තියෙනවා. එයා ප්ලෑන් එක අනුමත කර ගත්තා කියලා මට ඉදිරිපත් කරා. මම ඒකයි කිවුවා කරන්නේ. මම දැන ගනිපු වෙලාවේ කතා නොකර ඇවිල්ලා මෙහේදී ඒක තහනම් කිරීමක් කරා. මැතිවරණය දවසේ මම නිවසේ සිටියේ නැහැ. මම අම්බලන්ගොඩ හිටියේ. මැෂින් එකක් ගෙනල්ලා ඇළ මාර්ගය වහලා දාලා ගිහිල්ලා. දැන් මට ගෙදරින් එළියට බහින්න විදියක් නැහැ. වටේ මිනිස්සු ටික කියනවා මොකක්ද දැන් ඕකේ ඉඳලා වැඩක් නැහැනේ වෙන වැඩක් බලාගෙන ඉන්න කියලා. ගේ ඉස්සරහ එකටත් ඔහොම කරලා ගියාට පස්සේ ඔතන ඉඳලා වැඩක් නැහැ කියනවා. ඇළ උඩට කපලා තියෙනවා. අපේ ගෙවල් පැත්තෙන් විතරක් දැනට ඒක තියෙනවා උඩ පැත්තට ගෙනිහිල්ලා. ජස්ටින් කන්දේ ඉඳලා එන වතුර පාරේ එන්නේ.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, ගිය සභා වාරයේදී කිවුවා කොට්ඨාශ මට්ටමින් වෙන් කරලා අපේ කොට්ඨාශවලට උපකාර්යාලයෙන් කම්කරුවෝ ගන්නත්, මේ කාර්යාලයෙන් අනිත් කොට්ඨාශ වලට කම්කරුවෝ ගන්නත්. අද වෙනතුරු ගිය සභා වාරයෙන් පස්සේ එක කම්කරුවෙක් හම්බවුණේ නැහැ. ලයිට් වාහනයෙන් ඇහුවම කියනවා අපිට නෙමෙයි අපිට නෙමෙයි කියලා. කම්කරුවෝ ටිකවත්, ලයිට් වාහනයවත් අපිට දැන් හම්බවෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මෙහෙමයි. ඕකේ වැරැද්දක් වෙලා තියෙනවා. මේ වෙලාවේ ඒක කියන්න ඕන. එවෙලේ මම ඒකට එකඟ වුණේ නැහැ. කොහොමත් මුළු සභාවම ඒක දන්නවා ඇති. ප්‍රීමික්ස් වලට එහේ කම්කරුවෝ ටික ඉන්න ඕන. මෙතනින් ඒක දෙකට බෙදිලා තිබුණා. නමුත් ඒක මේකෙන් ඉවරයි. මේ රොටේෂන් එකෙන් ඒක ඉවරයි. එහෙම කරන්න බැහැ. උප කාර්යාලයේ අය ප්‍රීමික්ස් පොජෙක්ට් එකට ඉන්න ඕන. ඒක කඩාකප්පල් කරගෙන යන්න බැහැ. ලයිට් ප්‍රශ්නයටත් ඕක බලපානවා. ඒක හින්දා ඔය දීපු එකෙන් ඉවරයි ඕක. ඒ අයට මම කිවුවා දෙන්න කියලා. අතහැරුණු අයට දෙන්න කියලා කිවුවා මම. තව එක දවසක් දෙන්න පුළුවන් මන්ත්‍රීතුමියට. තව එක දවසක් යනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා මා හරහා ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීමට කියලා.

ගාල්ල - බද්දේගම මාර්ගය සංවර්ධනය කිරීමේ ගැටලු. (කේ. ඩී. ජයසුන්දර මයා, ''අමරසිරි'', පෝද්දල.)

බද්දේගම පාර පුළුල් කිරීම සම්බන්ධව ජයසුන්දර මහත්තයාගේ ඉල්ලීමක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැඩිච්ච ගොඩනැගිල්ල හදන්න පුළුවන්. අලුත් ඉදිකිරීම් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අලුත් ඉදිකිරීම් කරන්න බැහැ. දැන් සම්පූර්ණයෙන් කැඩෙනවානම් තියෙනවා ඒක ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. අලුතෙන්ම කරනවානම් විතරයි අඩි 50 තියන්න ඕන. නැත්නම් ඒ තියෙන මායිමට පුළුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඊළඟට තව ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. මේකත් සභාගත කරන්න අවශ්‍යයි.

නිවස ආසන්නයේ ඇති අනාරක්ෂිත ගස් ඉවත් කර ගැනීම සඳහා. (ඊ. පී. අසේල ප්‍රියංක මයා, නො. 138/ඩී, කතළුවගේ වත්ත, පෝද්දල.)

මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ, පෝද්දල ඉඩමේ අයිනේ ඉන්න අසේල මහත්තයාගේ ඉල්ලීමක්. ගරු සභාපතිතුමා, දැන් එතුමා කැමතියි අර පාර දෙන්න අපිට ඉඩමට යන්න. ආදාහනාගාරය දැන් කොහොමත් එතන කෙරෙන්නේ නැහැ. ඒ නිසා ගැටලුවක් පැන නගින්නේ නැහැ. නමුත් ඉඩමට යන්න පාර සුද්ධ කරලා ඉඩමේ කම්බි ගහලා ඉඩම සභාව සතු කර ගන්න කියලා ඉල්ලනවා. නැවතත් ඒ සභාවෙන් දාපු කණු කඩලා තියෙනවා. ඉතිං මේ ගැන සොයා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වට කරලා වැට ගහලා සභාව සතු පොදු සුසාන භූමිය කියලා බෝඩ් එකක් ගැහුවානම් හරි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක කරන්න කියලා බොහොම ගෞරවනීය ඉල්ලීම මේ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඊළඟ සභාවට ඔබතුමා විධිමත් යෝජනාවක් විදියට දාන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, රත්නගිරිවත්තේ ගම්වැසියන්ට අනතුරුදායක ගසේ අතු කපා ඉවත් කිරීමට තීරණය කරලා තියෙනවා. ඒකට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ලිපියක් ලැබිලා තියෙනවා එම ලිපිය සභාවට ඉදිරිපත් කරන්න අවසර ලබා දෙන්න.

උදාර පෙදෙසේ මාර්ගය අබලන්ව පැවතීම සම්බන්ධවයි. (එකමුතු සුභ සාධක සමිතිය, උදාර පෙදෙස, ආනන්ද මාවත, කිතුලම්පිටිය, ගාල්ල.)

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගයේ මුල් කොටස කාපට් කරේ ලක්ෂ හතළිස් තුනක මුදලකින්. ඒ මුදලත් අපි හොයා ගත්තා. මේකට අවශ්‍ය ඇස්තමේන්තු කටයුතු තාක්ෂණ නිලධාරි විසින් කරගෙන යනවා. එම මුදලත්, මේකට අවශ්‍ය සම්පූර්ණ වියදමත් අපි හොයා ගන්නවා. සභාවෙන් අපිට අවශ්‍ය වන්නේ අනෙකුත් කටයුතු පමණයි. අපිට මේ ඇස්තමේන්තුව ඉක්මනින් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාවෙන් අවසරයි, ගරු සභාපතිතුමනි,

නිවෙස්වලට යන පාර සභාවේ ජේ. සී. බී. යන්ත්‍රය යොදවා සංවර්ධනය කිරීම. (ලබුදූව, කුරුන්ද කන්දේ ගම්වාසීන්)

කුරුන්ද කන්දේ ඉඩම් කැබලි අංක 75, 56, 58, 54, 59 යන ඉඩම් වල නිවාස හතරක්, පහක් ඉදිකරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඒ මිනිස්සු මීටර් 100ක විතර දුර ප්‍රමාණයක් ගල් වලට කකුල තියලා පඩි වගේ සාදා ගෙන තමයි උඩට නැගලා යන්නේ ගෙවල් වලට. ඒක දැන් අවුරුදු හතළිහක්, පනහක් විතරම ඒ විදියට තමයි කරලා තියෙන්නේ. අර ඉඩම් වලට යන්න පාරක් තියෙනවා. ප්ලෑන්වලත් සඳහන් වෙලා තියෙනවා. ඔප්පු වලත් සඳහන් වෙලා තියෙනවා පාරක් තියෙනවා කියලා. මේ ප්‍රශ්නය සුමිත් උප සභාපතිතුමත් දන්නවා චාලට් නැන්දලාගේ ගෙදර ළඟ ප්‍රශ්නය මේ. ඒ පාර හදලා දෙන්න කියලා කීප වතාවක්ම ඒ මිනිස්සු උත්සාහ කරත් ඉඩම් හිමියන්ගෙන් ප්‍රශ්න ඇවිල්ලා තියෙනවා. ඒ නිසා මේ මිනිස්සු පාර හදන එක අතඇරලා දාලා තියෙනවා. සභාවේ ජේ. සී. බී. යන්ත්‍රය යොදවලා පාර කපන්න පුළුවන් වේවි අපිට ප්ලෑන්වලත් සඳහන් වෙලා තියෙන නිසා. මේ සභාවේ ජේ. සී. බී. යන්ත්‍රය යොදවලා පාර සකස් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ස්ථිර කරන්නකෝ. ඊට පස්සේ අපේ තාක්ෂණ නිලධාරීව යවලා බලලා ඉවර වෙලා ප්ලෑන් එකේ පාරක් තියෙනවානම් සභාවේ ජේ. සී. බී. එක දාලා කපනවා එච්චරයි. අපේ අයිතියක් තියෙන එකක් කරන්න බැරිකමක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක කරන්න පුළුවන් මෙහෙම. මේ රජයේ ඉඩම් බෙදපුවානේ. මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. අපේ තාක්ෂණ නිලධාරි හරහා වාර්තාවක් කැඳවනවා. අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා කරලා වැඩේ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කුරුන්ද කන්දේ සොහොන් පිටියේ වැඩේ කොහොමද.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තාම ඒක එහෙමමයි. තව වෙනතුරු ඒක වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාට නැවතත් මතක් කරනවා අර කමිටුවෙන් කරන්න ඕන වැඩක් නෙමෙයි. මේ කියන එක ඔබතුමන්ලාගේ අපේ සභාවකින් කරපු වැඩකුත් නෙමෙයි. අර තරංගා ලැන්ඩ්ස් එකේ ලිපිගොනුව ගෙන්න ගන්න එකට ලියුමකින් දන්වන්න. ලියුමක් දාලා අපිටත් ඒකේ පිටපතක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඉල්ලන්න ලිඛිතව අපිට ඒ අදාළ පිටපත් ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලිඛිතව ඉල්ලලා අපිටත් දෙන්න ඒකේ පිටපතක්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කරුණු කිහිපයක් තියෙනවා දැනගන්න. කපුහෙම්පල සල්මල් උයනේ මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා

තියෙනවා. අවුරුදු පහක ගිවිසුම් කාලයක් තියෙනවා නේද ඒ ෆිනෑන්ස් කම්පැනියත් එක්ක. අද වෙනතුරු ඒක නඩත්තු කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කිව්වානේ ගිවිසුම් කාලය අවුරුදු පහට කිට්ටු ඒවාට ලියුම් දාන්න කියලා. කරනවාද ඒවා. දැන් මේ කියන්නෙත් ඒවගේ එකක් නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල සල්මල් උයන ගැන අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපි කියලානේ තියෙන්නේ තාක්ෂණ නිලධාරීන්ට අවුරුදු පහ, හතර, තුනට කිට්ටු ඒවායේ පාරවල් වල සංවර්ධන කටයුතු කරන්න කියලා දන්වන්න. ඒවා හදලද තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔය කල්යාම තුළ ගිවිසුම් කාලය අවසන් වෙනවා ඒකයි වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු පහ පැන්නම කවුද වගකියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තම තමන්ගේ කොට්ඨාශවල ඒවා දෙන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා කියලා තියෙන්නේ. ඇයි නොකරන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගිය සභාවට ඉස්සෙල්ලා සභාවේදීත් සභාපතිතුමා මේ ගැන කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ මාසයේ සභාවට කලින් ඒක කෙරෙන්න ඕන. තමන්ගේ වගකීමක් ඒක. තමන් පුද්ගලිකව කරන්න ලේස්ති වෙන්න නැත්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟ කරුණ ගරු සභාපතිතුමනි කුරුන්ද කන්දේ සොහොන් පිටිය මැදින් යන පාර. අර එක පුද්ගලයෙක් පාවිච්චි කරනවා. සභාවේ දේපලක් ඒක. සොහොන්පිටිය මැදින් දැනට කාර් දුවනවා. ඒක පෙර සභාවාරවලදීත් කිහිපවාරයක්ම කතා කරා. පාර වහන්න කියලා කිව්වා. පොලීසියේ පැමිණිල්ලක් දාලා ඒ අදාළ කටයුතු කරන්න කිව්වා. තව වෙනතුරු කිසි දෙයක් නැහැ. මම ඊයේ පෙරේදාත් ඒ පැත්තේ යනකොට දැක්කා. හොඳටම මටත් දොස් කිය කිය පාර නැවත හදලා කට්ටිය ගමන් බිමන් කරනවා. එක පුද්ගලයෙක්ගේ වුවමනාව තියෙන්නේ. ගිය වතාවේ කිව්වේ සභාපතිතුමා පොලීසියේ පැමිණිල්ලක් දාලා ඒ සහාය ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැම එකක්ම මට එකින් එක බලන්න බැහැනේ ඉතිං.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සති දෙකක් ඇතුළත කරන්න කිව්වා.

(ගරු මන්ත්‍රී ඒ. ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ ඉන්න නිලධාරීන් බලන්න ඕන. සභා තීන්දුවක් ගත්තම ඒක ක්‍රියාත්මක කරන්න ඕන. එකින් එක කියන්න බැහැනේ ඇඟිල්ලෙන් ඇන ඇන. ෆිනෑන්ස් ඉඩම්වල පාරවල් අවුරුදු එක, දෙක, තුන, හතර, පහ විදියට හොයන්න කිව්වා. ඊළඟ සභාව වෙනකම් මුකුත් නැහැ. මම කරපු එකක්, බලපු එකක් කියන්න. එකක් දෙන්න එකක්. එකක් බැලුවානම් එකක් දෙන්න. මේ ඉන්න තුන් දෙනාගෙන් එක්කෙනෙක් දෙන්න මට මෙන්න මේක බැලුවා කියලා මට මාසයක් යනකම්. මට දැන් දෙන්න. මෙන්න මේ ෆිනෑන්ස් ඉඩම බැලුවා කියලා දැන් දෙන්න. මට තුන්දෙනා එක්ක කතා කරලා බලපු එකක් දෙන්නකෝ මාසයක් යනකම්. බොරුවක්නේ මේ කරන්නේ. මම නිකං හැල්ලුවට ලක් වෙනවා හැම සභාවකදීම.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හරි බොහොම ස්තුතියි එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිව්වා සුද්ද සිංහලෙන්. ෆිනෑන්ස් ෆයිල් ටික අරගෙන අවුරුදු තුන, හතර, පහ ඒවා බලන්න. අවුරුදු පහ පහුවුණාට පස්සේ කවුද වගකියන්නේ. අපි එපැයි වග කියන්න. සභාව එපැයි වගකියන්න ඕන. ඔයගොල්ලෝ කවුරුවත් වගකියන්නේ නැහැනේ. කරුණාකරලා ඊළඟ මාසය වෙනකොට ඉවර කරන්න. ෆිනෑන්ස් ඉඩම් සීයක් දෙසීයක් නැහැනේ. පහළොවක්, විස්සක් ඇති උපරිම. මට කතා කරලා ඊළඟ සභාව වෙනකොට ඕක ඉවර කරලා ඕන. මට බැහැ උත්තර දෙන්න. ඔයගොල්ලෝ උත්තර දෙන්න නැත්නම්.

කොටින්ම ලේකම්තුමා ඔබතුමත් බලන්න ඕන මීට වඩා. ප්‍රමුඛතාවය තියෙන ඒවා බලන්න ඕන. දැන් ආදාහනාගාරය හදන ඉඩමට එන්. බී. ආර්. ඕ. රිපෝට් එක තාම ගන්න බැරි වුණානේ. තව මොනවද කතා කරන්නේ. අපේ ආයතනයට අවශ්‍ය එන්. බී. ආර්. ඕ. රිපෝට් එක තවම ගන්න බැරි වුණා. දැන් රමේෂ්

පතිරණ ඇමතිතුමා අහනවා කෝ කෝ කිය කිය. අදාළ දේවල් එහෙම නොදී මේ ඉඩම අපිට පවරා ගන්නේ කොහොමද, අපිට එක දවසෙන් ගන්න පුළුවන් එකක් නේ. එන්. බී. ආර්. ඕ. එක රාජ්‍ය ආයතනයක්නේ. ඇඟිල්ලෙන් ඇන ඇන එකින් එක කියන්න බැහැනේ. අන්තිමට ඔය ගොල්ලොත් මගේ ඔළුවනේ කන්නේ. මේ වගේ හිනා වෙවී කතා කරන්නේ නැහැ කවුරුවත්. නිලධාරීන් හුරතල් කරලා ඔක්කොම කරයි. අන්තිමට මගේ ඔළුව කන්න තමයි ඔයගොල්ලොත් එන්නේ. ඔය හිනා වෙවී කියන කතා නිලධාරීන්ට ඔයගොල්ලෝ කියන්න එන්නේ නැහැනේ කොයිවෙලාවකවත්. අන්තිමට මගේ ඔළුව කන්න තමයි කවුරුත් එන්නේ. තේරුණාද, එහෙම දොස් කියන කොටත් කට්ටියට රිදෙනවා. මෙහෙමයි. මම ටෙල්සිටත් කියලා තියෙනවා හරිද, ටෙල්සිටත් මම කියලා තියෙනවා මේ සභාවේ වැදගත් දේවල් ටික, කෙරෙන්න ඕන ටික ලියා ගන්න කියලා. ඒක කෙරෙන්න ඕන. ඊළඟ සභාවේදී ඒක මඟහැරුණොත් ඉවරෙට ඉවරයි. ඒ හින්දා අදාළ නිලධාරීන්ගෙන් ඒ ටික මට ඊළඟ මාසය වෙන කොට ඕන. ඒක මම ආයෙත් කියන්නේ නැහැ. කරන්න බැහැනේ. සභාව විහිළුවක්නේ. අද කතා කරනවා. ඊළඟ සභාව වෙනකොට මතක නැහැ. එහෙම අතහැරලා දාලා යන්න බැහැ. මම මේක මතක තියාගෙන ඉන්න වෙන වැඩ නැත්නම් හොඳයි. කියන කියන එක මතක තියාගෙන ඉන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා තව එකක් අමතක වුණා ප්‍රකාශ කරන්න. මීපාවල අමරසූරිය විද්‍යාලය ඉදිරිපිටින් ඇති මාර්ගය පුළුල් කිරීම සම්බන්ධව වසර එකොළහකට කලින් තමයි පවරා ගැනීම සිදු කරලා තියෙන්නේ. අදාළ ලිපිගොනුව හොයා ගත්තා. අදාළ ලිපිගොනුවේ සියලුම කරුණු අඩංගු වෙලා තියෙනවා. ගිවිසගෙන තියෙනවා ඒ ඉඩම දෙන්න. සභාවට ඒ ඉඩම පවරලා දීලා තියෙනවා. ඒ තාප්පය කඩලා අලුතෙන් තාප්පය බඳින්න ප්ලෑන් එක පවා ඒකේ සඳහන් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ බැකෝ යන්ත්‍රය යොදලා ඒක කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එතකොට ඒකට අවශ්‍ය රුපියල් ලක්ෂ විස්සක ප්‍රතිපාදන මම ඒකට යොදවලා තියෙනවා. අර ගමට දෙන, ග්‍රාමසේවා වසමට දෙන ලක්ෂ විස්සේ ප්‍රතිපාදන මම ඒකට යොදවලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කඩා ඉවත් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ රුපියල් ලක්ෂ විස්සෙන් කරන්න පුළුවන් වෙන්නේ ගල් වැටිය පමණයි. තාප්පය බැඳීම සභාවේ යම් මුදලකින් කරන්න වෙන්නේ. ලිපි ගොනුව හොයා ගත්තා. ලිපිගොනුවේ සියලු කරුණු අඩංගුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මුදල් ඇවිල්ලානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** රුපියල් ලක්ෂ විස්සක මුදල් දැන් ඇවිල්ලා තියෙන්නේ. කරන්න පුළුවන් අද හෙට වුණත්. අපිට මැනුම කරලා ඒක කරලා දෙන්නයි ඕන. කරුණාකරලා මැනුම් කටයුතු ටික කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මැදිහත් වෙලා චමින්ද මන්ත්‍රීතුමත් එක්ක වැඩේ කෙරෙන තත්ත්වයට සකස් කරන්න. ඒ ලිපිගොනුව හොයා ගන්න බැරුව හිටියනේ මාස ගාණක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විස්තර තියෙනවාද.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ලිපිගොනුවේ සියලුම විස්තර ටික තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් නැත්නම් ඔය ලක්ෂ විස්ස යනවා. අපරාදේ. ඕක ගන්න පුළුවන් වෙලාව මේ. සභාවට මේ මුදල් ගෙවලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාවට ගෙවලා කියලා නෙමෙයි ඒ ලිපිගොනුවේ තියෙන්නේ. දීපු ඉඩම් කොටස තියෙනවා. සභාවට ගෙවන 1% ක් දීලා නැහැ. ඉඩම් කොටස තමයි සභාවට දීලා තියෙන්නේ. පාර පළල් කරන්න ඉඩම් කොටස තමයි සභාවට දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ දිනූෂ මහත්තයා එක්ක එකතු වෙලා ඕක ඉවර කර ගන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්කත් කතා කරන්න. ඔබතුමා මැදිහත් වෙන්නකෝ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, වැලුව තොටුපොළ අපි යෝජනාවක් ගෙනල්ලා සංවර්ධනය කරන්න තීරණය කරා. එතන පොල් ගස් වගයක් හිටවලා තියෙනවා. මොකක්ද දන්නේ නැහැ ඒකට වෙලා තියෙන්නේ. වැටක් ගහන්න යෝජනා කරේ. දැන් ඒක ඇතුලේ පොල් පැළ වගයක් හිටවලා තියෙනවා. සභාපතිතුමා ඒ තොටුපල බැලුවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකේ වැට ගහමු. කලින් අපි ගිහිල්ලත් බලපු තැනනේ. හරි, ඒක ඉවත් කරලා වැට ගහමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, දැන් චමින්ද මන්ත්‍රීතුමා කතා කරපු කාරණය සම්බන්ධව ඒ ලිපිගොනුවට අදාළ ලියකියවිලි මමත් බැලුවා එක වෙලාවක. ඒකත් පැහැදිලිව තියෙනවා. මම හිතන්නේ මේක වුණේ මාදුගොඩ සභාපතිතුමා ඉන්න කාලයේ. ඒකේ පැහැදිලිව ඒ එකඟතාවයට ඇවිල්ලා තියෙනවා. ඒ ඉඩම් අයිතිකාරයොන්ගෙන් කිසි ගැටලුවක් නැහැ. එයාලා කියන්නේ පොරොන්දු වුණ විදියට ඒක කරන්න කියලා. එච්චරයි. වෙන ගැටලුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මමත් කතා කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ප්‍රශ්නයක් තියෙනවානේ එතන. අදහසක් තියෙනවා අදාළ ආයතනයෙන් සභාවට මුදල් වෙන් කරා කියලා. අන්න ඒක තමයි ගැටලුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මුදලක් නෙමෙයි. ඉඩම් කොටසක් වෙන් කරලා තියෙන්නේ. ඒ අය මුදල් අරගෙන, අදාළ ෆිනෑන්ස් ආයතනයෙන් මුදල් අරගෙන ඉඩම් කොටසක් වෙන් කරලා දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මමත් කාරණය පැහැදිලිව දන්නවා. ඒ ඉඩම විකුණන වෙලාවේ පොදු එකඟතාවයක් තිබිලා තියෙනවා. ඉඩම විකුණන්න බැහැ අදාළ පාරේ පළල පෙන්වන්නේ නැතුව. එවෙලේ ඒ අය ඉඩම් කොටස මුදලට දෙන්න එකඟ වෙලා තියෙනවා. හැබැයි ප්‍රමිතියට අදාළව ඒ අයගේ බැම්ම ඉදිකරලා, තාප්පය ඒ ප්‍රමිතියෙන් ඉදිකරලා දෙන්න ඕන කියලා තියෙනවා. ඒක තමයි එකඟතාවය. හැබැයි ඒ වෙලාවේ සභාවෙන් තාප්පය හදලා දෙනවා කියලා එකඟතාවයකට ඇවිල්ලා තිබුණේ නැහැ. ඒකට අදාළ ආයතනයෙන් තමයි එකඟ වෙලා තිබුණේ ඒ අය ඉදිකරන්න කැමතියි කියලා. ඒ වෙනුවෙන් සභාව කරනවා කියලා තමයි ඒ ආයතනය විසින් සභාවට මුදල් බැන්දා කියලා කියන්නේ. ඔය සම්බන්ධව තමයි ගැටලුව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** හරි මෙහෙම කරන්නකෝ. දැන් ඔබතුමත් ඕන නම් මැදිහත් වෙන්න. චමින්ද මන්ත්‍රීතුමයි, අපේ තාක්ෂණ නිලධාරි එක්ක ඕකේ ලිපිගොනුව අරගෙන බලන්න. ඕන නම් ගෙනල්ලත් බලමු. බලලා ඒ අදාළ කටයුත්ත කරාම ඉවරයිනේ අරහේ මුදලුත් තියෙන එකේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඇත්තටම ඒ මාර්ගයේ අදාළ ස්ථානය පටුයි. ඉතාමත්ම පටුයි. ඒක ඉක්මන් කරන එක හොඳ කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විධිමත් සභා යෝජනාවක් ඒකට කලින් දාලා තියෙනවා නේද.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔව්. මමත් කලින් දැම්මා.

ඒ වගේම තමයි ගරු මන්ත්‍රීතුමන්ගෙන් මම ඉල්ලා සිටිනවා දූව වත්තට යන මාර්ගයත් කැඩිලා ගියා ජලනල එලීමේදී. ඒකටත් ඔබතුමා මුදල් වෙන් කරා නේද, ඒ මාර්ග දෙක බරපතල ප්‍රශ්නයක්.

ඊළඟට ගරු සභාපතිතුමනි මට ඔබතුමා ලබා දීපු අවස්ථාවේ මේ කතා කරන්නේ. ඇත්තටම දැන් අපේ සභාව වෙනදට වැඩිය ඔබතුමන්ලාට බලය සහිතව කරන්න පුළුවන්. ආණ්ඩුව සහ කැබිනට් එකේ බලය තියෙනවා. ⅔ බලය සහිතව දැන් ඉස්සරහට ක්‍රියාත්මක වෙන්න පුළුවන්කම ලැබිලා තියෙනවා. ඒ හින්දා අපි විශ්වාස කරනවා මේ රටේ ජනතාව ඔබතුමාලා කෙරේ තබපු විශ්වාසය, ඔබතුමන්ලාගෙන් ඒ බලාපොරොත්තු වෙන දේ, වගකීම් ටික ඔබතුමාලා පොරොන්දු වෙච්ච ඒ කාරණාවන් ඒ විදියටම රට ඉස්සරහ ඉදිරිපත් කරයි කියලා. ඒ නිසා අපි යෝජනා කරනවා ඔබතුමන්ලාට මේ වෙලාවේ සභාවක් හැටියට ඔබතුමාට පුළුවන් යම් යම් ඉල්ලීම් කරන්න ⅔ ක බලයක් සහිත රජයක් තියෙන නිසා. රජයෙන් ඉටු කර ගන්න බැහැ කියන දෝෂාරෝපණය තියෙන්න විදියක් නැහැ දැන්. තව ඉස්සරහට ඔබතුමන්ලාට හරි පහසු වේවි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් දැන් තියෙන්නේ.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක මම පටන් ගනිද්දීම කිව්වා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා අර ඇත්තටම අපේ සභාවෙන් කරන පොදු ව්‍යාපෘති, පොදු කාරණා තියෙනවානේ. සභාවේ මට්ටමින් කර ගන්න බැරි දේවල් තියෙනවානේ. පාරකට තාර දාන්න, කොන්ක්‍රීට් දාන්න නෙමෙයි. ඉන් එහාට ගිය සභාවට වටිනාකමක්

තියෙන, සභාවේ වගකීම්, බලතල පැවරෙන, පොදු වගකීම්වලට මීට වැඩිය ලොකු ව්‍යාපෘති වලට යන්න රජයේ සහයෝගය ගන්න ඔබතුමන්ලාට මීට වැඩිය මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේදී මම ඒක සභාවට ඉදිරිපත් කරනවා. ඒ නිසා ඉදිරියේදී සභාවක් හැටියට තව පොඩි කාලයයි අපිට තියෙන්නේ. අවුරුදු එකහමාරක් දෙකක් තියෙන්නේ. අවුරුදු දෙකකට ආසන්න කාලයක් තියෙන්නේ. යම් වැඩක් කරලා සභාව මේ කාලය තුළ ඔබතුමාට සභා කාලය අවසන් කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දීර්ඝ නිවාඩුවකට පස්සේ අද දින මම සභාවට සහභාගි වුණා. මමත් ඇත්තටම පාර්ලිමේන්තුවට යන්න සටන් කළා. නමුත් අබේසේකර මන්ත්‍රීතුමා මට විරුද්ධව ප්‍රශ්න දාපු නිසා මම පසු බැස්සා. නැත්නම් මට පාර්ලිමේන්තුවට ගියත් වැඩක් නැහැනේ. මම කල්පනා කරා දැන් තේරුමක් නැහැ මෙතුමා මට විරුද්ධව පෙත්සමක් ගහලා තියෙන නිසා මම කල්පනා කරා පාර්ලිමේන්තුවට ගිහිල්ලා වැඩක් නැහැ කියලා. ඒ නිසා පසු බැස්සා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විරුද්ධව නෙමෙයි. ඒක නීතිය. පෙත්සමක් නෙමෙයි ඒක. ඒක හෙට දවසෙත් එහෙමයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මට සහයෝගය දක්වපු සියලුදෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම මේ මැතිවරණයේදී ගාල්ල ආසනයෙනුත් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගත්තේ මම. ගාල්ල ආසනය තුළ වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගන්න මට හැකියාව ලැබුණා. ඒ සම්බන්ධව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ජනතාවට මම ප්‍රණාමය පුද කරනවා. ඒ වගේම මම මේ ගමන යනකොට අඩුපාඩු රාශියක් දැක්කා ගරු සභාපතිතුමනි. මගේ කොට්ඨාශය තුළ මම ගෙයින් ගෙට යනකොට පොඩි පොඩි අඩුපාඩු ටිකක් මට දැන ගන්න ලැබුණා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා ඔබතුමා ගාල්ලෙන් වැඩිම මනාප ගත්තේ ටෙලිෆෝන් එකෙන්.

**එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකෙදි මම දැක්කා වීදි ලාම්පු විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කරන්න තියෙනවා. මම අදත් බැලුවා. අදත් කර ගන්න විදියක් නැහැ. මම හෙට දවසේවත් පොඩ්ඩක් දෙන්න. වීදි ලාම්පු විශාල ප්‍රමාණයක් හදන්න තියෙනවා. ඒ වගේම පොඩි පොඩි අඩුපාඩු රාශියක් තියෙනවා. ඒවාට උදවු කරන්න. සුද්ධ පවිත්‍ර කරන්න ටිකක් තියෙනවා. ඒකටත් ගරු සභාපතිතුමා කම්කරුවෝ දාලා අවස්ථාවක් දෙන්න ඒ ටික කරන්න. කම්කරුවෝ දවස් දෙකක්වත් දාලා සුද්ධ පවිත්‍ර කරන්න තියෙනවා. ඒ ටික කරන්න පොඩි අවස්ථාවක් ලබා දෙන්න. ඇත්ත වශයෙන්ම මැතිවරණය බොහොම සාමකාමීව පැවැත්වුණා කිසිම බාධාවක් නැතුව.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට රජයට ස්තුති කරන්න ඕන.

**එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ රජය නෙමෙයි, හිටපු රජය කොමිෂන් සභා පත් කරපු නිසා එහෙම වුණේ. කොමිෂන් සභා පත් කරපු නිසා කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ බලය නිසා ඒක වුණේ. ඉදිරියටත් බලාපොරොත්තු වෙනවා මගේ ගමන ඉදිරියට යන්න. අඩිය ඉස්සරහට තියන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒකෙදිත් ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020-09-15 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.